# ජංගම දුරකථන පිළිවෙත පාසල



## පිළිවෙත

වික්ටෝරියාවේ සියලු රජයේ පාසල් 2020 සිට නව ජංගම දුරකථන පිළිවෙතක් ක්‍රියාත්මක කළ යුතුය. මෙම පිළිවෙතට අනුව පාසලට රැගෙන එන සියලු ජංගම දුරකථනයන්, දවසේ පාසල් කාලය තුල ක්‍රියා විරහිත කර සුරක්ෂිතව තැන්පත් කර තැබිය යුතුය.

මෙම පිළිවෙතේ අරමුණ:

- සිසුන්ට ඉගෙනුම සඳහා අනුචිත ජංගම දුරකථන භාවිතාවන් (සයිබර් හිරිහැර කිරීම්ද ඇතුලුව cyberbullying) සහ වික්ෂේපයන්ගෙන් තොර සුරක්ෂිත පරිසරයක් ලබාදීම
- විවේක කාලය සහ දිවා ආහාර කාලය තුළදී සමාජ අන්තර්ක්‍රියා සහ ශාරීරික ක්‍රියාකාරකම සඳහා වැඩිතර අවස්ථා ලබාදීම.

## පර්යේෂණ

නව ජංගම දුරකථන පිළිවෙත පාදකවී ඇත්තේ පංති කාමරයේදී ජංගම දුරකථන බාධාකාරී බවට සහ පාසලේදී ඒවා අයථා පරිහරණයට විවෘත බවටත් සොයාගන්නා ලද පර්යේෂණ මතය. පාලනයෙන් තොරව ජංගම දුරකථන පංතියේ තිබීම නිසා සිසුන්ගේ සිතීමේ, ඉගෙනීමේ, මතක තබාගැනීමේ, අවධානය යොමු කිරීමේ සහ චිත්තවේග පාලනය කරගැනීමේ හැකියාවන්ට පීඩාදායක වියහැකි බවද මෙම පර්යේෂණ මගින් පෙන්වාදෙන ලදී. මෙම පර්යේෂණයන්හි සාරාංශයක් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පුහුණුව වෙබ් අඩවියේ ඇත. ( Department of Education and Training's website www.education.vic.gov.au (සොයන්න: mobile phones).

## නිතර අසන ලද ප්‍රශ්න

### සිසුන්ට ජංගම දුරකථන පාසලට ගෙන ඒමට පුළුවන්ද?

සිසුන්ට ජංගම දුරකථනයක් පාසලට ගෙන ඒමට පුළුවන. නමුත් එය දවසේ පාසල් කාලය තුල ක්‍රියා විරහිත කර සුරක්ෂිතව තැන්පත් කර තැබිය යුතුය. පාසලේ කාර්යාලය හරහා අවශ්‍ය වූ විට දෙමාපියන්ට තම ළමයින්ව ඇමතීමට හැකිය.

### මෙම භාවිතයට ව්‍යතිරේක තිබේද?

නව ජංගම දුරකථන පිළිවෙත ව්‍යතිරේක සුළු ගණනකට ඉඩ දෙයි. උදාහරණ ලෙසට ජංගම දුරකථනය පාවිච්චි කරන්නේ සෞඛ්‍ය තත්ත්වයක් කළමනාකරණය කරනු පිණිස නම් හෝ පංති කාමරයේ ඉගෙනුම සම්බන්ධ ක්‍රියාවලියකට උපකාර වනු පිණිස නම්. පංති කාමරයේ ඉගෙනුම සම්බන්ධ ව්‍යතිරේකයක් ගුරුවරුන් විසින් අනුමත කිරීමට හැකිය. අනික් සියලුම ව්‍යතිරේක විදුහල්පති විසින් අනුමත කළ හැකිය. ව්‍යතිරේක පිළිබඳව වැඩි තොරතුරු ඔබේ ළමයාගේ පාසලෙන් ලබා ගත හැකිය.

### සිසුන් පාසල් වේලාවේ ජංගම දුරකථනයක් ලඟතබාගන සිටිනු අසුවුවහොත් එහි ප්‍රතිඵල මොනවාද?

පාසල් වේලාවේ ජංගම දුරකථනයක් පාවිච්චි කරන සිසුන්ට ඔවුන්ගේ පාසලේ දැනට පවතින විනය ප්‍රතිපත්ති වලට අනුකූලව කටයුතු කරනු ලැබේ. මේ පිළිබඳව වැඩි තොරතුරු ඔබේ ළමයාගේ පාසලෙන් ලබා ගත හැකිය.

### නව පිළිවෙතට අනෙකුත් ජංගම උපකරණ ඇතුලත් වෙනවාද, උදා. ස්මාර්ට් ඔරලෝසු (smart watches) ?

දැනට මෙම නව පිළිවෙත ස්මාර්ට් ඔරලෝසු සහ/හෝ අයිපෑඩ් වැනි පළඳින තාක්ෂණයන්ට අදාල නොවේ. මේ උපකරණ පාසලට රැගෙන ආවොත් ඒවායේ දැනුම් දීම් (notifications) ක්‍රියා විරහිත කර තැබිය යුතුය. මෙම උපකරණ භාවිතය පිළිබඳව සීමාවන් තම පාසලේ ප්‍රතිපත්තියට ඇතුලත් කිරීමට පාසල් වලට පුළුවන.

## වැඩි තොරතුරු සඳහා

තම පාසලේ ජංගම දුරකථන පිළිවෙත ලබාගැනීමට ළමයාගේ පාසල අමතන්න.